# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.24 පැය 2220 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/829/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු**</u>

**01. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණු දිසා අපරාධ කොට්ඨාසය.**

2025.04.22 වන දින රාත්‍රී කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ ලක්සඳ සෙවණ නිවාස සංකීණර්යේදී ඩෑන් ප්‍රියසාද් යන අයට ගිනි අවියකින් වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීමේ අපරාධය සම්බන්ධයෙන් බස්නාහිර පළත් දකුණු දිසා අපරාධ කොට්ඨාසය විසින් විමශර්න කටයුතු සිදුකරමින් පවතී.

ඒ අනුව අනාවරණය වූ තොරතුරු මත **2025.04.24 වන අද දින සවස් කාලයේදී වැල්ලම්පිටිය පොලිස් වසමේ මීතොටමුල්ල ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝව අසලදී මෙම අපරාධයට සම්බන්ධ සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 140 ක්** සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 28 ක් වන මීතොටමුල්ල, වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු ගිනි අවියකින් වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීමේ අපරාධයට කුමන්ත්‍රණය කිරීම හා ආධාර අනුබල දීම සිදුකර ඇති බවට දැනට සිදුකරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත.

බස්නාහිර පළාත් දකුණු දිසා අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.**

2025.04.24 වන අද දින අළුයම් කාලයේ මොරටුව පොලිස් වසමේ මුරවත්ත ප්‍රදේශයේදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 700 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 29 ක් වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරටුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. හදිසි ගිනි ගැනීමක් - කොක්කඩිචෝලය පොලිස් වසම.**

2025.04.24 වන අද දින අළුයම් කාලයේ කොක්කඩිචෝලය පොලිස් වසමේ පරණ පොල පාර ප්‍රදේශයේ පිහිටි වෙළෙඳසැලේ හදිසි ගිනි ගැනීමකට ලක්ව ඇති බවට කොක්කඩිචෝලය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත වහා ක්‍රියාත්මක වූ පොලිස් නිලධාරීන් මඩකලපුව නගර සභා ගිනි නිවීමේ ඒකකය,

කොක්කඩිචෝලය යුධ හමුදා කඳවුරේ හා ප්‍රදේශවාසීන්ගේ සහය ඇතිව ගින්න මැඩ පැවැත්වීමට කටයුතු කර ඇත.

ගින්න හේතුවෙන් තුවාල හෝ ජීවිත හානි කිසිවක් සිදුව නොමැති අතර දේපල හානි පමණක් සිදුව ඇත. ගින්න ඇති වීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර කොක්කඩිචෝලය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - මූතූර් පොලිස් වසම.

2025.04.24 වන අද දින උදෑසන කාලයේ මූතූර් පොලිස් වසමේ ත්‍රිකුණාමලය මඩකලපුව ඒ 05 ප්‍රධාන මාගර්යේ පෙරිය පාලම ප්‍රදේශයේදී ත්‍රිකුණාමලය දෙස සිට මඩකලපුව දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් මාගර්යේ දකුණු පසට හැරවීමට යාමේදී එම දිසාවටම ධාවනය වූ  ලොරි රථයක් ත්‍රීරෝද රථයේ පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථ රියදුරු තුවාල ලබා ප්‍රතිකාර සඳහා මූතූර්  රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 62 ක් වූ මූතූර් 02 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මූතූර් රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මූතූර් පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**